# කොරියානු ජනරජයේ රැඳී සිටින විදේශිකයින් සඳහා මෙම ශීත ඍතුවේ දී ලබාදෙන නව COVID-19 බූස්ටර් මාත්‍රාව සඳහා වන මාර්ගෝපදේශය

COVID-19 ද්වීසංයුජ එන්නත් ලබා ගැනීමේ හැකියාව පුළුල් කිරීම
නව COVID-19 බූස්ටර් එන්නත සඳහා වන සුදුසුකම වයස අවුරුදු 18 සහ ඊට වැඩි අය දක්වා පුළුල් කෙරේ. දරුණු රෝගාබාධ සහ මරණවලින් වැලකීම සඳහා වඩා හොඳ ආරක්ෂාවක් ලබාගැනීමට කරුණාකර මෙම නව බූස්ටර් මාත්‍රාව ලබාගන්න.

## එන්නත ලබාගැනීම සඳහා සුදුසුකම්

අවුරුදු 18 සහ ඊට වැඩි සහ මූලික ඒන්නත් මාලාව ලබාගෙන ඇති පුද්ගලයන්

අවුරුදු 18 සහ ඊට වැඩි
- ✓ පළමු මාත්‍රාව
- ✓ දෙවන මාත්‍රාව

## මාත්‍රා අතර කාලපරාසය

අවසන් කොවිඩ් 19 එන්නත ලබාගැනීමෙන් දින 120 ක් ගත වූ පසු

*COVID-19 වැලඳුනු පුද්ගලයන්ට COVID-19 අවසන් එන්නත් මාත්‍රාව ලබාගෙන මාස 4 කට පසුව හෝ COVID-19 ආසාදනය තහවුරු කිරීමෙන් මාස 4 කට පසුව බූස්ටර් එන්නත ලබා ගැනීම නිර්දේශ කෙරේ. මෙහිදී බලපැවැත්වෙන්නෙ අවසාන වශයෙන් ගත හැකි කාරණයයි.

## එන්නත් වර්ගය

**ඔමික්‍රෝන් පදනම් කරගත් ද්වීසංයුජ එන්නත**

- Moderna BA.1
- Pfizer BA.1
- Pfizer BA.4/5

※ **සටහන:** mRNA COVID-19 එන්නත් සඳහා විකල්ප ලෙස Recombinant COVID-19 එන්නත් (Novavax හෝ Skycovione) ඉදිරිපත් කළ හැක.

## එන්නත ලබාගැනීම සඳහා වේලාවක් වෙන්කර ගැනීම

1. **ලියාපදිංචි වූ විදේශිකයන් : මාර්ගගතව, දුරකථන ඔස්සේ සහ එදිනම වේලාවක් වෙන් කර ගත හැකිය.**
**※බූස්ටර් මාත්‍රාව සඳහා වෙලාවන් වෙන් කිරීම ඔක්තෝබර් 27 වැනි දින ආරම්භ විය. බූස්ටර් මාත්‍රාව නොවැම්බර් 11 සිට ක්‍රියාවෙහි යෙදේ. (එකම දින වේලාවක් වෙන්කර ගැනීම ලබාගත හැක)**
2. **ලියාපදිංචි නොකළ විදේශිකයන් සඳහා : මහජන සෞඛ්‍ය මධ්‍යස්ථානයකින් නිකුත් කරන ලද තාවකාලික කළමනාකරණ අංකයක් ලබාගැනීමෙන් පසු එන්නත් ලබාදෙන මධ්‍යස්ථානයක් ඇමතීමෙන් හෝ ඒ වෙත පැමිණීමෙන් වෙලාවක් වෙන් කර ගත හැක.**
3. **කොරියානු ජනරජයෙන් පිටත දී ප්‍රාථමික එන්නත් මාලාව සම්පූර්ණ කළ පුද්ගලයන් සඳහා : මහජන සෞඛ්‍ය මධ්‍යස්ථානයක තම එන්නත් වාර්තාව ලියාපදිංචි කිරීමෙන් පසු වේලාවක් වෙන්කර ගත හැක.**

※සටහන

මාර්ගගතව වේලාවක් වෙන්කරගැනීම සඳහා පවතින ද්වාරය : https://ncvr.kdca.go.kr (අන්අය සඳහා වේලාවන් වෙන්කිරීමේ හැකියාව ද පවතී)

දුරකථනය ඔස්සේ වේලාවක් වෙන්කරගැනීම : 1339 ඔස්සේ KDCA ඇමතුම් මධ්‍යස්ථානය හෝ පළාත් පාලන ඇමතුම් මධ්‍යස්ථානය අමතන්න

එදිනම වේලාවක් වෙන්කරගැනීම: අමතර එන්නත් සඳහා වේලාවක් වෙන් කරගැනීම Kakaotalk සහ Naver සමාජ මාධ්‍ය වේදිකා හරහා මාර්ගගතව හෝ සෘජුවම වෛද්‍ය මධ්‍යස්ථාන ඇමතීමෙන් සිදුකරගත හැක.

※ විදේශ ශ්‍රම බලකායේ උපදේශන මධ්‍යස්ථානය 1577-0071 මගින් ඇමතීමෙන් උපදේශනය ලබාගත හැක (දින 365 ම පවතී)